සියලු ම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாண கல்வித் திணைக்களம்
Department of Education North Western Province

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES 2023

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2024

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

I පත්‍රය

විභාග අංකය : .....

කාලය පැය 1 යි.

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :


- **ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.**
- **තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ දී ඔබේ විභාග අංකය ලියන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්නපත්‍රයේ ම සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.**

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

1. පහත රූපය නිරීක්ෂණය කර ඒ පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.



(1) ළමයි මුහුදු වෙරළේ වැලි මාලිගාවක් සදති.
(2) පිරිමි ළමයා හිස් වැසුමක් පැළඳ සිටියි.
(3) අහසේ දීප්තිමත් ව ඉර පායා ඇත.

2. A රූපයට සමාන රූපයක් ලබා ගැනීම සඳහා B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කොපමණ ද?

A



B



(1) 1 (2) 2 (3) 3


3. පහත ඇති කවියෙහි හිස්තැන්වලට ගැළපෙන වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

ඈත අහසෙ පාවෙනවා
..... අරන් රඟ දෙනවා
තද ..... ආවෝතින්
නොපෙනී ..... යනවා

(1) වතුර, වැස්සක්, බිමට (2) නූල, සුළඟක්, ඈතට
(3) කොළය, අව්වක්, පහළට

- අංක 4 සහ 5 ප්‍රශ්නවල කොටුව තුළ ඇති රූප කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.

4.






(1)



(2)



(3)

5. 



(1)



(2)




(3)

6. විමලාගේ වැඩිමහල් දියණිය රුවනි ය. රුවනිගේ නැගණියගේ පියා ධර්මසේන ය. ධර්මසේන හා විමලා රුවනිගේ කවුද?
(1) බාප්පා, පුංචි අම්මා (2) මාමා, නැන්දා (3) පියා, මව

7. පිරිමි ළමයි 10 බැගින් කණ්ඩායම් 10 ක් ද, ගැහැනු ළමයි 6 බැගින් කණ්ඩායම් 10 ක් ද විය. පසුව ක්‍රියාකාරකමක් සඳහා පිරිමි ළමයි 20 ක් හා ගැහැනු ළමයි 5 ක් බැගින් වූ මිශ්‍ර කණ්ඩායම් සැකසීමට තීරණය කළේ නම් මෙහි සිටි ළමුන්ගෙන් සෑදිය හැකි කණ්ඩායම් ගණන කීයද?
(1) 17 (2) 05 (3) 12


8. හිරුණි හිරුණට වඩා අවුරුදු තුන හමාරක් වැඩිමල් ය. හිරුණි ඉපදුණේ 2006 වර්ෂයේ දී ය. හිරුණ ඉපදුණේ,
(1) නිසැකවම 2002 වර්ෂයේ ය.
(2) නිසැකව ම 2003 වර්ෂයේ ය.
(3) 2002 හෝ 2003 වර්ෂ දෙකින් එකක ය.

9. අද 2024 පෙබරවාරි 12 දින වේ. අද හමු වූ අපි තව දින 105කට පසු දින බුදු මැදුර සාදා විවෘත කිරීමට තීරණය කළෙමු. ඒ අනුව බුදු මැදුර විවෘත කිරීමට නියමිත දිනය වන්නේ,
(1) මැයි 26 (2) මැයි 27 (3) මැයි 28


10. 


පහත රූපය පාට කිරීමේදී එක ළඟ එකම වර්ණය නොගැවෙන සේ වර්ණ ගැන්වීමට යොදාගත හැකි අවම වර්ණ ගණන වන්නේ,
(1) 3 යි (2) 4 යි (3) 2 යි


11. සුනිමල්ගේ අයියා නුවන් ය. කුමාරි යනු සුනිමල්ගේ සහෝදරියකි. කුමාරිට නංගියෙක් සිටියි. කුමාරිගේ නැගණියට සිටින සහෝදරයන් හා සහෝදරියන් ගණන පිළිවෙළින් ලියන්න.
(1) 2 සහ 1 වේ (2) 1 සහ 2 වේ (3) 2 සහ 2 වේ

12. 

වෘත්තාකාර පිට්ටනියක A,B,C,D සිසුන් හතරදෙනා මුහුණට මුහුණලා ස්ථානගතව සිටියි. දෙන ලද විධානයකට අනුව අංක 01 යැයි පවසන විට සිසුවාගේ වම් අත පැත්තට එක් ස්ථානයක් මාරුවිය යුතුය. අංක 02 යැයි පැවසූ විට ඔහුගේ දකුණු අත පැත්තට එක ස්ථානයක් මාරුවිය යුතුය. විධානය ලැබුණේ 2, 2, 1 ලෙසයි. ඒ අනුව A,B,C,D නිවැරදිව ස්ථානගත වී ඇති රූපය වන්නේ,

(1) 

(2) 

(3) 

13. පහත දී ඇති තොරතුරු ඇසුරෙන් පිළිතුරු සොයන්න.

කඩල 1kg	**සීනි** 250g
රු.110.00	

සීනි 250g	**කව්පි** 500g
රු.160.00	


කඩල 1kg	**කව්පි** 500g
රු.190.00	

කඩල 500g	**කව්පි** 1kg


මිල කීය ද?


(1) රු.270.00 (2) රු.175.00 (3) රු.285.00

14. අංක 14 හා 15 ප්‍රශ්නවල රූප රටාවේ ඊළඟට එන රූපය තෝරන්න.









(1)  (2)  (3) 

15. 

.....

(1)  (2)  (3) 

16. හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.



(1)  (2)  (3) 

17. පහත සඳහන් සිදුවීම් සලකන්න.


a. ඉදුණු අඹ ගෙඩියක් කමින් ගිරවෙක් හිටියා.
b. අපි ඇවිදින ශබ්දයට උෆ ඉගිළී ගියා.
c. අපි දෙදෙනාටම දුක හිතුණා.
d. මමත් නංගිත් වත්ත පහළ ඇවිදින්න ගියා.
e. ගස්වල අඹ ඉදිලා තිබුණා.


මෙම සිදුවීම්වල නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?


(1) a,b,c,d,e (2) d,e,a,b,c (3) a,c,b,d,e

18. දී ඇති සංකේත භාවිත කර පේළියේ දෙපැත්තේ ම අගය සමාන වන පිළිතුර තෝරන්න.



(1) 

(2) 


(3) 

19. පෝලිමක බිනුල් සිටින්නේ වම් කෙළවරේ සිට 10 වෙනියා ලෙසය. කේමිණී දකුණු කෙළවරේ සිට 15 වෙනියා ය. බිනුල් හා කේමිණී අතර ළමයින් 4 දෙනෙක් සිටී නම් බිනුල් සිටින්නේ දකුණු කෙළවරේ සිට කී වෙනියාට ද?
(1) 12 (2) 11 (3) 10

20. කිතුල් පැණි වර්ග දෙකකින් A වර්ගයේ ලීටරයක වටිනාකම රුපියල් 280 කි. B වර්ගයේ ලීටරයක වටිනාකම රුපියල් 220.00 කි. මෙම වර්ග දෙකෙන් ම විවිධ ප්‍රමාණ ගෙන ලීටර 14 ක් සෑදූ විට එහි වටිනාකම රුපියල් 3,440.00 ක් නම් මිලදී ගත් A වර්ගයේ කිතුල් පැණි ප්‍රමාණය කොපමණ ද?
(1) 8 (2) 6 (3) 14

21. මෙවර පැවති වයඹ පළාත් මීටර 100 දුර දිවීමේ තරගය පිළිබඳව A,B,C,D යනුවෙන් ප්‍රකාශ හතරක් පහත දී ඇත.
A. නයනාට පෙර සීතා තරගය නිම කළා ය.
B. කමණීට පසුව තරගකරුවන් දෙදෙනෙක් තරගය නිම කළෝ ය.
C. කමණීට පෙර නයනා තරගය නිම කළ අතර විමලාට පෙර කාංචනා තරගය නිම කළා ය.
D. ගීතානි තරගය නිම කළේ නැත.
ඉහත ප්‍රකාශ අනුව කමණී තරගයේ කී වැන්නා ද?
(1) තුන්වැන්නා (2) දෙවැන්නා (3) සිව්වැන්නා


22. රූපයේ දැක්වෙන්නේ සමාන ලී කුට්ටි සමූහයක් යොදාගෙන කර ඇති අසම්පූර්ණ ගොඩනැගීමකි. ලොකු හරි හතරැස් ලී කුට්ටියක් ලැබෙන පරිදි මෙම ගොඩනැගීම සම්පූර්ණ කිරීමට තව කුඩා ලී කුට්ටි කීයක් අවශ්‍ය වේ ද?




(1) 57 (2) 64 (3) 30

23. මීනා, සීතා, රාධා, සුපුන් හා මොහොමඩ් යන පස්දෙනා අතුරෙන් මීනාට වඩා වයසින් බාල තිදෙනෙකු පමණි. රාධාට වඩා වයසින් බාල දෙදෙනෙකු පමණි. සීතාට වඩා වයසින් බාල මොහොමඩ් පමණි. මේ අය අතුරෙන් වැඩිමහල් ම කවුරුන් ද?
(1) මීනා (2) සුපුන් (3) රාධා

24. I රූපයෙහි අඳුරු කර ඇති කොටු පමණක් වැසෙන සේ II රූපය කිසියම් ආකාරයකට ඇල වූ විට සමචතුරස්‍රයක් ලැබේ. එම සමචතුරස්‍රයේ ඇති කොටු ගණන කීය ද?



I රූපය




II රූපය

(1) 16 (2) 36 (3) 25


25. 5A, 5B සහ 5C පන්ති තුනෙහි සිටින ශිෂ්‍ය සංඛ්‍යා පිළිවෙළින් 48, 46 සහ 47 වේ. ඉන් එක් පන්තියක ගැහැනු ළමයින් සංඛ්‍යාවට වඩා පිරිමි ළමයි පස්දෙනෙක් වැඩියෙන් සිටිති. එලෙස සිටින්නේ,
(1) 5A පන්තියේ ය. (2) 5B පන්තියේ ය. (3) 5C පන්තියේ ය.

26. සිසුන් පිරිසක් අනුරාධපුරය, යාපහුව, පොළොන්නරුව යන රාජධානි නරඹා ඇති ආකාරය පහත රූපසටහනින් දැක්වේ.



අනුරාධපුරය නරඹා ඇති මුළු සිසුන් ගණන කීය ද?

(1) 7 (2) 6 (3) 10

27. 

මෙම රූපයේ ඇති සෘජුකෝණාස්‍ර සංඛ්‍යාව හා ත්‍රිකෝණ සංඛ්‍යාව සම්බන්ධයෙන් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) සෘජුකෝණාස්‍ර සංඛ්‍යාව ත්‍රිකෝණ සංඛ්‍යාවට සමාන ය.

(2) සෘජුකෝණාස්‍ර සංඛ්‍යාව ත්‍රිකෝණ සංඛ්‍යාවට වඩා එකකින් වැඩි ය.

(3) සෘජුකෝණාස්‍ර සංඛ්‍යාව ත්‍රිකෝණ සංඛ්‍යාවට වඩා දෙකකින් වැඩි ය.

28. ළමයෙකු වයස අවුරුදු 10 හා 16 වන විට ප්‍රසිද්ධ විභාග දෙකකට ඉදිරිපත් වේ. ගීතා, නීතාට වඩා අවුරුදු 5කින් වැඩිමහල් ය. ගීතා පළමුවර පළමුවැනි විභාගයට ඉදිරිපත් වන්නේ 2024 වර්ෂයේදී ය. නීතා දෙවනවර විභාගයට ඉදිරිපත් විය යුතු වර්ෂය කුමක් ද?

(1) 2029 (2) 2045 (3) 2035

29. ඔරලෝසුවක වේලාව 5.30 යි. එතැන් සිට මිනිත්තු කටුව හතර වාරයක් පැය කටුව පසු කර ගොස් 12 දෙසට යොමු වී තිබෙන විට එම ඔරලෝසුවේ වේලාව කීය ද?

(1) 9.30 (2) 10.00 (3) 10.30

30. රැස්වීම් ශාලාවක පුටු 200 ක් ඇත. එම පුටු අංක 1 සිට 200 තෙක් අංක කර ඇත. එම පුටු අතරින් 140 සිට 160 තෙක් අංක කර ඇති පුටුවල පිළිවෙළින් අංක 1 සහ 5 ඉලක්කම් එක ළඟ යෙදෙන අංක සහිත පුටු කොපමණ තිබේ ද?

(1) 11 (2) 12 (3) 10

31. දී ඇති සටහනෙහි පහළට හෝ හරහට හෝ එක ළඟ ඇති ඉලක්කම් දෙකක එකතුව 8 වන පරිදි යෙදෙන අවස්ථා ගණන කීය ද?

1	4	5	3
7	4	2	5
3	5	6	4
2	4	3	6

(1) 6 (2) 7 (3) 5

32. වෛද්‍යවරයෙක් රෝගියෙකුට බෙහෙත් වර්ගයක් දීම සඳහා පහත සඳහන් උපදෙස් දී ඇත.

- එක් වරකට පෙති 3 බැගින් දිනකට දෙවරක් (කෑමට පසු) ගන්න.
- රෝගියාට ලබාදුන් බෙහෙත් පෙති ගණන 45 කි. පළමු බෙහෙත් වේල උදේ කෑමට පසු ගත්තේ නම් එම පෙති ගණන **සම්පූර්ණ දින** කීයකට ප්‍රමාණවත් ද?

(1) 7 (2) 8 (3) 9

33. A,B,C ලෙස නම් කරන ලද ඔරලෝසු තුනක එකම දිනක අවස්ථා දෙකක දී දැක්වුණු වේලාව වගුවේ දී ඇත.

ඔරලෝසුව	A	B	C
පළමුව දැක්වුණු වේලාව	06:30	06:20	06:25
පැය දෙකකට පසු දෙවන අවස්ථාවේ දැක්වූ වේලාව	08:30	06:20	08:35


මේ අනුව වඩාත් නිවැරදි නිගමනය කුමක් ද?

(1) එක් ඔරලෝසුවක පමණක් ක්‍රියාකාරීත්වය දෝෂ සහිතයි.
(2) එක් ඔරලෝසුවක පමණක් නිවැරදි වේලාව දක්වයි.
(3) ඔරලෝසු දෙකක නිවැරදි වේලාව පෙන්වයි.

34. සුපුන් ඉපදුනේ එක්තරා වර්ෂයක මැයි මාසයේ පළමු බ්‍රහස්පතින්දා ය. නයනා ඉපදුනේ සුපුන් ඉපදී දින 22 ක් ගත වූ දින ය. ඒ අනුව නයනා ඉපදුන දවස කුමක් ද?
(1) සිකුරාදා ය. (2) බ්‍රහස්පතින්දා ය. (3) බදාදා ය.

35. අධික වර්ෂාව හේතුවෙන් ගඟ පහළ කොටස ගංවතුරෙන් යටවිය. සහන සේවකයෝ වහාම නිවැසියන් ආරක්ෂිත ස්ථාන කරා බෝට්ටුවකින් ගෙන ගියෝ ය. පළමු වර බෝට්ටුවේ පිරිමි පස්දෙනෙක්, අම්මාවරුන් තිදෙනෙක් හා කුඩා ගැහැනු ළමයි දෙදෙනෙක් ගෙන ගියහ. දෙවන අවස්ථාවේ බෝට්ටුවේ පියවරු තිදෙනෙක්, අම්මාවරු තිදෙනෙක් හා පිරිමි ළමයි දෙදෙනෙක් ගෙන ආහ. මේ අනුව බෝට්ටුව වාර දෙකේදීම ආරක්ෂිත ස්ථාන කරා රැගෙන ගිය මුළු කාන්තාවන් ගණන කොපමණ ද?

(1) 8 (2) 7 (3) 9

36. 

මෙම රූපය තද ඉරි සලකුණු පිටතට සිටින සේ තබා ඝනකයක් සදා ගන්නා ලදී. එම ඝනකයේ නිවැරදි රූපය තෝරන්න.


(1)


(2)



(3)

37. මඩොල්දූව, අපේ ගම, හීන්සැරය සහ හත්පණ යන පොත් අතුරෙන් මීනා පොත් දෙකක් කියවා නැත. සුරාජ් පමණක් මඩොල්දූව පොත කියවා ඇත. නුවන් මෙන්ම මීනා ද අපේ ගම සහ හීන්සැරය යන පොත් කියවා ඇත. මේ අනුව **මීනා නිශ්චිතව ම,**

(1) හීන්සැරය සහ හත්පණ පොත් දෙකෙන් එකක් කියවා නැත.
(2) අපේ ගම සහ හත්පණ යන පොත් දෙක කියවා ඇත.
(3) මඩොල්දූව පොත කියවා ඇත්තේ සුරාජ් පමණි.

38. සචින්දට කලිසම් 5 ක්, කමිස 3 ක් හා ටී ෂර්ට් 2 ක් තිබේ. කලිසමක් හා කමිසයක් ඇඳ සචින්ද මංගල උත්සවයකට සහභාගී විය හැකි ආකාර ගණන කොපමණ ද?
(1) 27 (2) 15 (3) 21

39. පහත රූපයේ ඇත්තේ නගරයකට යාම සඳහා ළමයෙක් නිවසෙන් තම ගමන ආරම්භ කර මංසන්ධි පසුකරමින් ඉදිරියට ගමන් කළ ආකාරයකි.



ඒ අනුව,

- පළමු මංසන්ධියෙන් දකුණට ඇති මාර්ගය දිගේ ඉදිරියට ගමන් කර, ඊළඟට හමු වූ මංසන්ධියෙන් වමට හැරී රෝහල වෙත යාමේ දී,

(1) ඔහුට වම්පසින් ක්‍රීඩා පිටිය ද, දකුණුපසින් බැංකුව ද දක්නට ලැබේ.
(2) ඔහුට වම්පසින් බැංකුව ද, දකුණුපසින් ක්‍රීඩා පිටිය ද දක්නට ලැබේ.
(3) ඔහුට වම්පසින් වෙළඳපොළ ද, දකුණුපසින් බැංකුව ද දක්නට ලැබේ.

40. පහත දැක්වෙන්නේ කොටුව දුම්රිය නැවතුම්පළෙන් පිටත්වීමට නියමිත දුම්රිය පිළිබඳ සටහනකි.

ගමනාන්තය	පිටත්වීමට නියමිත වේලාව		වෙනත් සටහන්
	පෙ.ව.	ප.ව.	
කන්කසන්තුරේ	9.30	-	පැයක් ප්‍රමාද වී ධාවනය වේ.
අනුරාධපුර	-	2.40	
ගාල්ල	6.35	-	අවලංගු කරන ලදී.
මහව	-	4.45	-
බදුල්ල	-	2.50	මිනිත්තු 30 ක් ප්‍රමාද වී ධාවනය වේ.

ඉහත සටහනට අනුව දුම්රිය ධාවනය වූයේ නම් එම දුම්රිය පිටත් වූ අනුපිළිවෙළ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ගාල්ල, කන්කසන්තුරේ, අනුරාධපුර, බදුල්ල
(2) කන්කසන්තුරේ, අනුරාධපුර, බදුල්ල, මහව
(3) ගාල්ල, කන්කසන්තුරේ, අනුරාධපුර, බදුල්ල, මහව

සියලු ම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாண கல்வித் திணைக்களம்
Department of Education North Western Province

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES 2023

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2024

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

II පත්‍රය

විභාග අංකය : .....

කාලය පැය 1 යි මිනිත්තු 15 යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :

- **ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.**
- **තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ දී ඔබේ විභාග අංකය ලියන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- **අංක 01 සිට 29 තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තිත් ඉරි මත ලියන්න.**
- **අංක 30 සිට 59 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු තුන බැගින් දී ඇත. නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**
- **කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.**

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	
	V/I/S
පළමු පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	
	V/II/S/CH

- **පහත දැක්වෙන ඡේදය කියවන්න.**

01. වෙල්යාය රන්වන් පාටින් බබළයි. පැසුණු වී කරල් සුළඟට ලෙළදෙයි. පඹයා නිසොල්මනේ වෙල මැද්දේ සිටගෙන සිටියි. ගිරවු රංචු පිටින් වී කරල් කෑමට කුඹුරට එති. දිනපතා ගිරවු පලවා හැරීමට හේරත්හාමි මාමා උදෑසනින් ම කුඹුරට එයි. මෙම දසුන දෙස මම ඉතා ආසාවෙන් බලා සිටිමි.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

i. වෙල මැද්දේ සිටගෙන සිටින්නේ කවු ද? .....

ii. සුළඟට ලෙළදෙන්නේ මොනවා ද? .....

iii. 'සෙලවීමකින් තොර' යන අදහස හැඟවීමට ඡේදයේ යෙදී ඇති පදය කුමක් ද?

.....

iv. ඡේදයේ යෙදී ඇති වර්තමානකාල බහුවචන ක්‍රියාපදය තෝරා ලියන්න.

.....

v. "පැසුණු" මෙහි යෙදී ඇති පිලි දෙක නම් කරන්න.

(i) ..... (ii) .....

vi. "මම ඉතා ආසාවෙන් බලා සිටිමි." මෙම වැකිය බහුවචනයට හරවා ලියන්න.

.....

02. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. 1) ප්‍රකාසන 2) ප්‍රකාශන 3) ප්‍රකාෂණ

ii. 1) පෘතුගීසි 2) පෘතුග්‍රීසි 3) පෘතුගීෂි

iii. 1) සුලඟ 2) සුළග 3) සුළඟ

03. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් "✓" ලකුණ ද, වැරදි නම් "✗" ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

i. උෆ ගසින් ගසට පැන ගියේ ය. ( )

ii. සීයා උදෑසන ම අවදි වූවා ය. ( )

iii. ගම්වැසියෝ මේ වෘක්ෂය අසලට ආහ. ( )

iv. කැලෑවේ අඳුර දුටු මම බියට පත් වූයෙමි. ( )

04. පහත දැක්වෙන ක්‍රියාපද අතරින්, ඒකවචන අතීතකාල ක්‍රියාපදය තෝරා හිස්තැන මත ලියන්න.

කළාය, කළහ, කරන්නේ ය.	.....

05. පහත සඳහන් එක් එක් වචනයට ගැළපෙන විරුද්ධාර්ථ පදය බැගින් ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

1) ලස්සන - ..... 2) දිරන - .....

06. එක් එක් වගන්තිවල අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ කොටුව තුළින් තෝරා, දී ඇති හිස්තැනෙහි ලියන්න.

විමසීමකින් තොරව යමක් කිරීම/ එක කරදරයකින් නිදහස් වීමට සිතා කරන ක්‍රියාවෙන් තවත් කරදරයකට පත්වීම/ නුසුදුසු පුද්ගලයන්ට තනතුරු වරප්‍රසාද හිමිවීම නිසා අහංකාර වීම.

i. ඉඟුරු දී මිරිස් ගත්තා වගේ.

.....

ii. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ.

.....

07. සුදුසු විරාම ලකුණු යොදන්න.

අම්මේ මම හෙට ගෙදර එන්න ද

08. යුගල පදය සම්පූර්ණ කිරීමට ගැළපෙන පදය ලියන්න.


i. තෑගි - ..... ii. ..... වාහන


09. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ගොඩනගා හිස්තැනෙහි ලියන්න.

ඒ/ පිළිගත්තා ය/ ගුරුතුමිය/ ඉතා/ ආරාධනය/ සතුටින්

.....

10. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

i. 

ii. 

11. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. you/ Do/ a/ shirt ?/ have - .....

ii. the/ help/ to/ you/ I/ sweep/ floor - .....

12. එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

i. Broom - ..... ii. Water - .....

13. "වේණ්ඩුම්" යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල තේරුම ලියන්න.

.....

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.


හැමෝම ඇස් වහගන්න.

.....

15. 10 170 සහ 9 806 යන සංඛ්‍යා දෙකෙන් ලොකු සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

.....

16. ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාව විහිදුවා ලියන්න.




.....

17. පහත දැක්වෙන සංඛ්‍යා පහ අවරෝහණ පිළිවෙළට සැකසීමේ දී හරි මැදට යෙදෙන සංඛ්‍යාව කුමක් ද?

35 750, 53 070, 70 553, 35 570, 53 750 - .....

18. පලතුරු බීම සකස් කරන කර්මාන්ත ශාලාවකට එක් දිනක දී වාහන තුනකින් රැගෙන එන ලද අඹ ගෙඩි ප්‍රමාණය 18 105 , 9 000 සහ 24 688 ක් වේ. එදින ගෙන එන ලද මුළු අඹ ගෙඩි ප්‍රමාණය කොපමණ ද? .....

19. 

මෙම රූපයේ $\frac{5}{10}$ ක ප්‍රමාණයක් පාට වීම සඳහා තව පාට කළ යුතු ප්‍රමාණය භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....

20. සුජිත් ගෙන එන ලද වෙරළු මල්ල යහළුවන්ට බෙදා දුන් පසු ගෙඩි 6ක් එහි ඉතුරු විය. එම ප්‍රමාණය මුළු ගෙඩි ප්‍රමාණයෙන් $\frac{1}{4}$ කි. සුජිත් ගෙන ආ මුළු වෙරළු ගෙඩි ප්‍රමාණය කොපමණ ද? .....

21. පුටු 150 ක් 6 බැගින් පේළිවලට සකස් කරන ලදී. පේළි සංඛ්‍යාව කොපමණ ද?

.....

22. ත්‍රිකෝණාකාර මුහුණත් පමණක් ඇති ඝන වස්තුව කුමක් ද? .....

23. පැය 24 ඔරලෝසුවේ 15 : 15 ලෙස දැක්වෙන වේලාව පැය 12 ඔරලෝසුවේ වේලාවෙන් කීය ද? .....

24. මාළුවෙකුගේ බර මැනීමේ දී තරාදියේ එක් තැටියකට මාළුවා සහ 50 g පඩිය ද අනෙක් තැටියට පහත දැක්වෙන පඩි 2 ද යොදන ලදී. මාළුවාගේ බර කොපමණ ද?



.....kg ..... g

25. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍ය	මිල දී ගත් ප්‍රමාණය	මීටර 1 ක මිල	වටිනාකම
		රු. ශත	රු. ශත
පොප්ලින් රෙදි	3m 50cm	250 00	(i) …….
ෆැනල් රෙදි	(ii). ……..	600 00	450 00
මුළු මුදල			1 325 00

26. එක් ඇසුරුමක ඇති බිත්තර ගෙඩි ගණන 7 කි. එවැනි ඇසුරුම් 115ක ඇති බිත්තර ගෙඩි සංඛ්‍යාව කොපමණ ද? .....

27. භාජනයක ඇති ජලය ප්‍රමාණය 2*l* 25m*l* කි. එයට ජලය 4*l* 75m*l* ක් දැමුවේ නම් භාජනයේ ඇති මුළු ජල ප්‍රමාණය කොපමණ ද? .....*l* .....m*l*

28. වරහන් තුළ ඇති වචන, ගැළපෙන සේ වගුවේ හිස්තැන්වල යොදන්න.

(බිත්තිය, මේස ලෑල්ල)

සිරස් තල	තිරස් තල
(i)	(ii) .....

29. එක්තරා පන්තියක සිටින සිසුන් පාසල් පැමිණෙන ආකාරය පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

පැමිණෙන ආකාරය	වාර ගණන	සිසු සංඛ්‍යාව
පා ගමනින් පමණක්	||||| |||	8
බසයෙන් පමණක්	||||| ||||| ||	12
බසයෙන් හා පා ගමනින්	||||| |||||	10
යතුරු පැදියෙන්	||||| |	6

I. බසයෙන් පමණක් හා යතුරු පැදියෙන් පැමිණෙන මුළු සිසුන් සංඛ්‍යාව කොපමණ ද? .....

II. පන්තියේ මුළු සිසුන් සංඛ්‍යාව 40 ක් නම්, තොරතුරු ලබාගෙන නැති ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද? .....

- **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. "යුතුකම් ඉටු කරන්නට හා පුංචි පුංචි වගකීම් දරන්නට මාගේ හිතේ ඇති වුණු උනන්දුව මාගේ පවුලේ හැමදෙනාගේ ම සිත්වලට ඇති වේවා." මෙය,
(1) අධිෂ්ඨානය කි. (2) ප්‍රාර්ථනාව කි. (3) උදානය කි.

31. රාජ්‍ය ලාංඡනයේ ඉර හා හඳ දෙකෙන් නිරූපණය වන්නේ,
(1) සෞභාග්‍යය (2) සදාතන පැවැත්ම (3) ස්වයංපෝෂිත බව

32. රියදුරන් වටරවුමක දී,
(1) දකුණෙන් එන වාහනවලට ඉඩදිය යුතු ය.
(2) වමෙන් එන වාහනවලට ඉඩදිය යුතු ය.
(3) පදිකයින් සඳහා ඉඩ ලබාදිය යුතු ය.


33. පිළිසරණක් නොමැති දරුවන් පිළිබඳව කටයුතු කරන රාජ්‍ය ආයතනය වන්නේ,
(1) පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව
(2) පූර්ව ළමා සංවර්ධන අධිකාරිය
(3) රතු කුරුස සංවිධානය

34. කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයක් නොවන්නේ,
(1) යෝගට් (2) සෝයා (3) චීස්


35. ලෙඩ රෝගවලින් වැලකී නිරෝගීව සිටීමට අවශ්‍ය ආරක්ෂක ආහාරයක් වන්නේ,
(1) රටකජු (2) දෙල් (3) ගොටුකොළ

36. පුස්තකාලයක දී අන් අයට බාධා නොවන සේ නිශ්ශබ්ද ව හැසිරීම.
(1) ආවේගශීලී ක්‍රියාවකි (2) නිවැරදි ක්‍රියාවකි (3) වැරදි ක්‍රියාවකි


37. පහත දැක්වෙන අවස්ථාවලින් සාර්ථකව බල්බය දැල්වෙන අවස්ථාව දැක්වෙන්නේ,



(1)



(2)



(3)


38. ලංකාවේ පිහිටි ස්වභාවික වරායක් වන්නේ,
(1) කොළඹ වරාය (2) චීන වරාය (3) ත්‍රිකුණාමල වරාය

39. තමන් නොදන්නා ප්‍රදේශයක ගමන් කිරීමේ දී යම් ස්ථානයකට යාමට නියමිත මාර්ගය සොයා ගැනීමට උදවු කරගත හැකි ක්‍රමයකි.
(1) Map මෘදුකාංගය (2) ටෙලිමේල් (3) දුරකථන අංකය

40. ටිකිරි නෙට්බෝල් ක්‍රීඩාවේ දී ලකුණක් ලබා ගැනීම සඳහා,
(1) ක්‍රීඩා පිටියේ මැද සිටින්නා බෝලය උඩ දැමිය යුතු ය.
(2) ගෝල රකින්නා පන්දුව අල්ලා ගත යුතු ය.
(3) පන්දුව පිටියෙන් පිටතට යැවිය යුතු ය.

41. වගාවට හානි කරන ගොළුබෙල්ලන් විනාශ කර දමන සතෙකු වන්නේ,
(1) කපුටා (2) ගෙම්බා (3) ඇටිකුකුළා

42. මේ රූපයෙන් දැක්වෙන සරල යන්ත්‍රය වන්නේ,



(1) ආනත තලය
(2) දබරය
(3) කප්පිය

43. තට්ටු ගොඩනැගිලිවල ඉහළ මහලයට පහසුවෙන් නැගීම සඳහා වර්තමානයේ භාවිත කරනු ලබන්නේ,
(1) විදුලි සෝපානය (2) දොඹකරය (3) පඩිපෙළ


44. ශ්‍රී ලංකාවට ඒකදේශික උරගයෙක් හා ඒකදේශික ක්ෂීරපායි සතෙකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) වලිකුකුළා - කළු වඳුරා
(2) යක් කටුස්සා - කලවැද්දා
(3) යක් කටුස්සා - මල් පුලුට්ටා

45. "වන පැත්ත බිය පත්ව සය නම්.... //" මෙහි සඳහන් වන්නේ,
(1) තුරඟා වන්නම (2) හනුමා වන්නම (3) මුසලඩි වන්නම

46. පෙදරේරු කර්මාන්තයේ දී සිරස් බිත්තියක් කෙළින් පිහිටුවා ගැනීම සඳහා යොදා ගන්නා උපකරණය වන්නේ,
(1) ලෙවලය (2) ලඹය (3) මට්ටම් ලීය

47. ජලය හා බැඳුණු සංස්කෘතික සිරිතක් නොවන්නේ,
(1) වගාවන් සඳහා ජලය බෙදා හැරීම.
(2) සිංහල අවුරුද්දට ළිඳ හා ගණුදෙනු කිරීම.
(3) කෑමට ආරාධනා කිරීමේ දී වතුර වීදුරුවක් ඇල්ලීම.

48. වගාවකට එන සතුන් පලවා හැරීම සඳහා යොදා ගනු ලබන ඇටවුමක් වන්නේ,
(1) ජල රෝදය (2) වර්ෂාමානය (3) සුළං ටකය

49. 


5 ශ්‍රේණියේ ශිෂ්‍යයෙක් රූපයේ දැක්වෙන නිර්මාණය සිදුකරනු ලබන්නේ,
(1) මැටි භාවිතයෙන් ය.
(2) පොල්කටු භාවිතයෙන් ය.
(3) කඩදාසි භාවිතයෙන් ය.

50. පරිසර හිතකාමී ගෙවත්තක් සඳහා ඇති 3R සංකල්පයට අයත් නොවන්නේ,
(1) භාවිතය අවම කිරීම
(2) භාවිත නොකර සිටීම
(3) නැවත භාවිත කිරීම

51. 

මෙම ලේන්සුවේ ඇති මල මැසීම සඳහා යොදා ගත හැකි මැහුම් ක්‍රමයකි.
(1) වාටි මැස්ම (2) ප්‍රිස්මේන්තු මැස්ම (3) දම්වැල් මැස්ම

52. පාසලක අධ්‍යාපනය ලැබීමට සෑම ශිෂ්‍යයෙකුට ම ලැබෙන අවස්ථාව,
(1) අයිතිවාසිකමකි. (2) වගකීමකි. (3) පිනකි.

53. 


මෙම පින්තූරයේ දැක්වෙන්නේ,
(1) ආනන්ද කුමාරස්වාමි මහතා
(2) ආතර් සී.ක්ලාක් මහතා
(3) C.W.W.කන්නන්ගර මහතා


54. රත්නදීප ජන්ම භූමි - ලංකාදීප විජය භූමි.... ගීතය ගායනා කරන්නේ,
(1) සුනිල් ශාන්ත මහතා
(2) සී.ටී.ප්‍රනාන්දු මහතා
(3) ඩබ්ලිව්.ඩී.අමරදේව මහතා


55. මුහුදු පතුලේ ඇතිවන භූමිකම්පාවක් නිසා උදම් රැළි ගොඩබිමට පැමිණීම හඳුන්වන්නේ,
(1) සුනාමි (2) ගංවතුර (3) භූමිකම්පා

56. උඟව පළාතට හා සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) රත්නපුර - කෑගල්ල (2) කෑගල්ල - හම්බන්තොට (3) බදුල්ල- කෑගල්ල

57. සුළඟ ආධාරයෙන් ක්‍රියා කරන සංගීත භාණ්ඩයකි.


(1)


(2)


(3)

58. පොළොවේ ඇති ජල මූලාශ්‍රවලට හානි ඇති කරන විද්‍යුත් අපද්‍රව්‍යයක් වන්නේ,
(1) සෙල්ලම් බඩු (2) ජංගම දුරකථන බැටරි (3) ඉටි රෙදි

59. ලෝක උරුමයක් ලෙස නම් කර ඇති වනාන්තරය කි.
(1) සිංහරාජ වනාන්තරය
(2) විල්පත්තු වනාන්තරය
(3) යාල වනාන්තරය

60. පාසල නිම වී බසයට නැගීමට පැමිණි ඔබේ යහළුවා වූ සුපුන් හදිසියේ ම ක්ලාන්ත වී බිම ඇද වැටුණි. ඒ අවස්ථාවට මුහුණ දෙමින් ඔබ ක්‍රියාකරන ආකාරය පිළිබඳ නිර්මාණාත්මක වැකි 3 ක් ලියන්න. (සෑම වගන්තියක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1. .....

.....

2. .....

.....

3. .....

.....